The Journal of Archaeology and Heritage Studies (JAHS) 9 (II) 2022: 106-112 pp

JAHS

The Journal of
ARCHAEOLOGY & HERITAGE STUDIES

Journal Home page http://fssh.rjt.ac.lk/index.php/jahs/

**Research Paper**

# මහගම තඹ සන්නස

**ටී.ජී. කුලතුංග**

සේවාර්ජිත සම්මානිත මහාචාර්ය, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, tgkulatunge@gmail.com

**සංක්ෂිප්තය**

ශ්‍රී ලංකාවේ අතීතයේ ප්‍රදානය කරන ලද සන්නස් සෑම අවස්ථාවකදීම පෞද්ගලික ප්‍රදානයක් පිළිබඳ තොරතුරු සපයයි. මහගම සන්නස මහනුවර රාජ්‍ය ලේඛනාගාරයේ පැවතියත් මෙතෙක් ප්‍රකාශයට පත්ව නොමැති හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ 6 වැනි පරාක්‍රමබාහු රජතුමාගේ 46 වැන්නේ හෙවත් ක්‍රි.ව. 1461 වර්ෂයේ දී එවකට උඩරට පාලනය භාරව සිටි ප්‍රධානියා වූ ජෝතිය සිටු විසින් කම්මල් කරුවෙකුට කුඹුරු හා ගොඩ ඉඩම් ප්‍රවේණි කොට දෙනු ලබන ප්‍රකාශනයකි. සන්නසට අනුව දිවානවත්තේ ලංකා නමැත්තෙකු විසින් මහසෙනයා නමැත්තෙකුට ප්‍රවේණියට සලස්වා මහගමින් කුඹුරු හා ඉඩ කඩම් ප්‍රදානය කර තිබේ. මෙය ඔහු විසින් ම වෙනත් කම්මල් කරුවෙකට කුඹුරු හා ගොඩ ඉඩම් ප්‍රවේණි කොට දෙනු ලබන මඩවල සෙල් ලිපියට සාකල්‍යයෙන් ම සමාන ය. මෙම ලිපියේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ මහගම සන්නස පිළිබඳව පාඨකයාට හඳුන්වා දීමයි. ජෝතිය සිටු විසින් මෙසේ තැන තැන කම්මල්කරුවන්ට ඉඩම් ප්‍රවේණිකොට පවරන්නේ කුමක් අරමුණු කොට ද යන්න විස්තරාත්මකව මෙම පත්‍රිකාවෙහි සාකච්ඡා වන අතර, ඔහු ස්වාධීන පාලකයෙකු ලෙස 6 වන පරාක්‍රමබාහු රජුට විරුද්ධව කැරළි ගැසීම දක්වා බලසම්පන්න වන ආකාරය සෙසු සාහිත්‍ය මූලාශ්‍රය අනුව යමින් මෙහි පෙන්වා දෙයි.

**මුඛ්‍ය පද: මහගම සන්නස, 6 වන පරාක්‍රමබාහු රජතුමා, ජෝතිය සිටුතුමා, ඉඩම් ප්‍රවේණි**

ARTICLE INFO

*Article history:*
Received 03 February 2023
Accepted 03 November 2023
Available online 30 December 2023

## 1. හැඳින්වීම

සිරිසඟබො ශ්‍රී පරාක්‍රමාහු රාජ්‍ය සමයට අයත් තඹ සන්නසක් මහනුවර රාජ්‍ය ලේඛනාගාරයේ ඇතත් එය මෙතෙක් ප්‍රකාශයට පත්ව නැත. මෙය මහගම සන්නස යනුවෙන් හැඳින්වේ. ඊට හේතුව මෙම සන්නසෙන් දිවානවත්තේ ලංකා නමැත්තෙකු විසින් මහසෙනයා නමැත්තෙකුට ප්‍රවේණියට සලස්වා මහගමින් කුඹුරු හා ඉඩ කඩම් ප්‍රදානය කිරීම සඳහන් වන නිසා ය. පාත දුම්බර පල්ලෙගම්පහ කෝරළයට අයත්වන මහගම ප්‍රදේශය ගහලගම්බොඩ, එගොඩගම, සහ මෙගොඩගම යනුවෙන් කොටස් තුනකට බෙදෙයි (Lawrie 1898, 518 p) සන්නස ප්‍රදානය කළ වර්ෂය වශයෙන් සඳහන් වන්නේ සිරිසඟබො ශ්‍රී පරාක්‍රමබාහු රජුගේ සතළිස් හය වන රාජ්‍ය වර්ෂය ඉකුත් වීමෙන් පසුව බව ය. මෙහි සඳහන් වන පරාක්‍රමබාහු රජු හඳුනා ගැනීම අපහසු නොවේ. ලිපියේ ඇති අක්ෂරවල ස්වරූපය, වසර 46 කට වඩා රාජ්‍ය කළ පරාක්‍රමබාහු කෙනෙකු වීම හා



*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk*

ලිපියේ සඳහන් **දිවානවත්තේ ලංහ** යන නාමය අනුව මේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රාජ්‍ය කළ 6වන පරාක්‍රමබාහු රජු බව සනාථ වේ. ලංකා ඉතිහාසයේ සඳහන් පරාක්‍රමබාහු නම් ලත් රජවරුන් අතරින් වසර 46කට වැඩි කාලයක් රාජ්‍ය කළේ 6 වන පරාක්‍රමබාහු පමණකි. පළමුවන පරාක්‍රමබාහු පවා රජකම් කළේ වසර 33 කි. ඒ අනුව මෙම සන්නස පැහැදිලිව ම 6 වන පරාක්‍රමබාහු සමයට අයත් වේ. එතුමාගේ රාජ්‍ය කාලය 1415 සිට 1467 දක්වා වූ වසර 52 ක් වේ. 6 වන පරාක්‍රබාහු රජුගේ අභිෂේක වර්ෂ අනුව ගණනය කිරීමේ දී 46 වැන්න වැටෙන්නේ ක්‍රිස්තු වර්ෂ 1461 ට ය. මෙහි අක්ෂර 15 වන සියවසට අයත් කළ හැකි ය. ස්වර්ණාභිෂේකය ලැබීමට පෙර එතුමා රයිගම වසර 3ක් පාලනය කළ නමුත් ස්වර්ණාභිෂේක වර්ෂය වන්නේ 1415 වර්ෂයයි (පරණවිතාන, 1972, 639 පිට). ලිපියේ සඳහන් විස්තර එතුමාගේ 46 වන වර්ෂය ඉකුත් වීමෙන් පසු ලියා ඇති මඩවල සෙල්ලිපියට සමාන අතර එහි දීමනාව ප්‍රදානය කරන්නේ ද දිවානවතතේ ලංකාධිකාර නමැත්තෙක් ය. මහගම සන්නස නමින් හැඳින්වෙන මෙම තඹ සන්නසේ දීමනාව කරනු ලබන්නේ දිවානවත්තේ ලංකා හ නමැත්තෙකි. මෙහි දිවානවත්තේ ලංකා හ යනුවෙන් කෙටිකර ලියන්නට ඇත්තේ භාවිත කර ඇති තඹ තහඩුවේ ලිවීම සඳහා ඉඩ මදි වීම නිසා බව ලිපිය පරීක්ෂා කිරීමේ දී පැහැදිලි ය.

## 2. මහගම සන්නස පෙළ

1. සිරිසඟබො ශ්‍රී පරාක්‍රමබාහු ච
2. ක්‍රවත්ති ස්වාමීන්වහන්සේට සත
3. ලිස් සවනෙන් මතු හවුරුදු බක් පුර
4. මහගම බ(ද) සැලැස්මෙන් උඩ හිඟුර බි
5. ජුවට සමුණ හා මෙහි බද ගම ගස
6. කොල (ද) වතු ගෙව(වා)ත්තයි ආවුද හා
7. මහසෙනයාට ප්‍රවේණි සලසා ඉරත් සඳු ඇති
8. තෙක් පවත්නා ලෙසට ෂලස්වා මීට කි
9. (සි)දා කව(ර)තරම් රජ කෙනෙකුන් ගෙනුත් අ
10. වුල් කළායයි නොකියන නො(ක)රණ ලෙ
11. සට සලස්වා දුන් දිවානවත්තෙ ලංහ
12. දුන් බවට තාමු ලේකයයි

(පෙළ කියවීම මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි)

මෙහි සඳහන් වන **දිවානවත්තේ ලං හ** යනු මඩවල සෙල්ලිපියේ ඇති **දිවානවත්තේ ලංකාධිකාර වම්හ** යන්න කෙටිකර දැක්වීමක් බව පෙනේ. ඔහු කවුරුන් දැයි හඳුනාගැනීමේ දී මඩවල සෙල්ලිපිය හා රාජාවලිය ඉතා වැදගත් වේ. මඩවල ලිපියේ ආරම්භයේ දී ඇපාණ වම්හ ජෝතිය සිටාණ වම්හ යනුවෙන් දීමනාව ප්‍රදානය කරන්නන් දෙදෙනෙකුගේ නම් සඳහන්ව ඇති අතර ලිපිය අවසානයේ දීමනාවට අත්සන් තබන්නන් සඳහා **දන්තොටවතුරේ දෙවන්** හා **දිවානවත්තේ ලංකා අධිකාර** සඳහන් කර ඇත. මෙහි සඳහන් දිවානවත්තේ ලංකා අධිකාර වනාහී ලිපිය ආරම්භයේ සඳහන් කර ඇති ජෝතිය සිටු බව කොඩ්රින්ටන් මෙන් ම පරණවිතාන ද හඳුනාගෙන තිබේ (Epigraphia Zeylanica 1933; Paranavitana, 1960, 676 p).

මහගම සන්නසෙන් මහගම ඉඩකඩම් පවරා දී ඇත්තේ යකඩ කර්මාන්තයේ යෙදුන මහසෙනයා නමැත්තෙකුට හා ඔහුගේ පරම්පරාවට බව සනාථ වන්නේ මඩවල ලිපියේ මෙන් ම මෙහි ද ආචාරි කුලයට අයත් ලාංඡනය සේ කිණිහිරය මිටිය හා අඬුව සටහන් කර තිබෙන බැවිනි. මඩවල ලිපියේ ද ඉඩම් පවරන්නේ ආචාරියෙකුට බව ***සිද්දාවුල්ලේ ආචාරි පරමනයාට*** යනුවෙන් එහි පැහැදිලිව ම සඳහන් කර තිබේ. ශිලාලේඛන සංග්‍රහයේ මඩවල ලිපිය ප්‍රකාශයට පත්කරමින් එච්.ඩබ්ලිව්. කොඩ්රින්ටන් ආචාරි යන්නට **සිල්වර් ස්මිත්** යනුවෙන් ඉංග්‍රිසියෙන් අර්ථ දී ඇතත් රන්රිදී වැඩ කරන ශිල්පීන් ඉංග්‍රිසියෙන් හඳුන්වන්නේ **සිල්වර් ස්මිත්** හා **ගෝල්ඩ් ස්මිත්** යනුවෙන් වුව ද යකඩ කර්මාන්තයේ යෙදෙන ආචාරි කුලයට අයත් ශිල්පීන් හඳුන්වන්නේ **අයන් ස්මිත්** යනුවෙන් බව සඳහන් කළ යුතු ය. රන්-රිදී-කරුවන් පුරාණයේ ශිලාලිපිවල තුලාව දරන්නන් යන අදහසින් තලදර හෝ තුලදර නමින් හඳුන්වා ඇත.

මෙම සන්නසින් මහසෙනයාට ප්‍රදානය කළ භූමිය අයත් වන්නේ මහගමට බව සඳහන් ය. එය දැනට මහනුවර දිස්ත්‍රික්කයේ කටුගස්තොට සිට මඩවල දෙසට දිවෙන මාර්ගයේ වම් පසින් ද කටුගස්තොට සිට අඹතැන්න දෙසට දිවෙන මාර්ගයේ දකුණු පසින් ද


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk



රූපය 01. මහගම තඹ සන්නස (ඡායාරූප අනුග්‍රහය, මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි)

සීමාවන මහගම මඩවල සෙල්ලිපිය අයත් වන පාත දුම්බරට ම අයත් ය. සන්නසේ ඇති පරිදි ප්‍රදානය හිමි මහසෙනයා හා ඔහුගේ පුතාට ආදී වශයෙන් මඩවල ලිපියේ සඳහන්ව ඇති ආකරයෙන් ම විස්තර සඳහන් ය. මෙහි ද කුඹුරු බිජුවට අමුණු සයක් හා ගහකොළ වතුපිටි ඇතුළත් ය. ඊට අමතරව මඩවල සෙල්ලිපියේ සඳහන් නැති ප්‍රදානයක් ලෙස ආවුද ද පවරා දීමක් සඳහන් ය. මඩවල ලිපියේ මෙන් මෙහි ද කිණිහිරය මිටිය අඬුව මෙන් ම ඉර හඳ බල්ලා හා කවුඩා රූප සටහන් කර තිබේ. ලිපියේ සඳහන් පරිදි පවරා දුන් භූමිය අයත් වන්නේ මහගම සැලැස්මෙන් (පිඹුරෙන්) උඩහිගුර නම් කුඹුර හා ඉඩම ය. එය ලෝරි විසින් සඳහන් කරන මහගමට අයත් ගහලගම්බොඩ එගොඩගම හා මෙගොඩගම යන ප්‍රදේශ තුනෙන් කුමන කොටසට අයත් දැයි පැහැදිලි නැත. 19 වන සියවසේ වූ එම බෙදීම් 15 වන සියවසේ නොතිබෙන්නට ද ඇත. තව ද මඩවල ලිපියේ ප්‍රදානය හා මහගම සන්නසේ ප්‍රදානය එක ම වර්ෂයේ දී සිදුකර ඇතත් මහගම සන්නස අප්‍රේල් මාසයේත් (බක් පුර) මඩවල දීමනාව මැයි මාසයේත් (වෙසඟ පුර) සිදුකර තිබේ.

මෙම සන්නසෙන් හා මඩවල සෙල්ලිපියෙන් සනාථ වන්නේ දිවානවත්තේ ලංකා අධිකාර හෙවත් ජෝතිය සිටු කෝට්ටේ 6 වන පරාක්‍රමබාහු රජුට විරුද්ධ වී ඉදිරි යුද්ධයකට සූදානමක් වශයෙන් යකඩ කර්මාන්තයේ යෙදුණු ආචාරි ශිල්පීන් ගෙන්වා වැටුප් සඳහා ඉඩකඩම් පවරා දී ආයුධ තැනීමේ කාර්යයෙහි යොදවන්නට ඇති බව ය. ඉදිරියේ සිදුවිය හැකි යුද්ධයකට සූදානම් වීමේ දී මෙසේ අවි ආයුධ සෑදීම පිලිබඳව ඉතිහාසයේ නොයෙක් වර සඳහන්ව ඇත. ජෝතිය සිටු නාමය රාජාවලියේ සඳහන්ව ඇත්තේ සෝජාත සිටු යනුවෙනි.

> ‘‘........ *ශ්‍රී පරාක්‍රමබාහු රජ ඔටුනු පැළඳ පනස් දෙකක් අවුරුදු රජකම් කර උඩරට රජකරන සෝජාත සිටු රජ අවුරුදු පතා එවන අයබදුත් ගෙන්වා වැඩට එවන මිනිසුනුත් ගෙන්වා ප්‍රමාද කර අංගම්පොර ඇර ඉදිනා බව අසා මහසේනාව එක්කරවා අඹුළුගල උන් කුඩාකුමාරයන්ට බාර දී උඩරට ජයගන්ඩ අවසර දුන්නාහ. අඹුළුගල රජ උඩරට කොටා ජයගෙන ඒ රජුගේ වරිගෙන් කීපදෙනෙකුත් අල්ලා කෝට්ටේ නුවරට එවුවාහ. ගම්පල රජවලායෙන් පැවතඑන රිවිකුලය ඒ රාජකුමාරයන්ඩ හා ඇමැත්තයාට උඩරට භාරකර දී අයබදු ගෙන්නා ගත්තාහ ......*’’
>
> (රාජාවලිය 1997, 219 පිට).


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

එහෙත් මේ පුවත දැක්වීමේ දී පැරකුම්බා සිරිත ජෝතිය සිටු යනුවෙන් සඳහන් කර ඇත.

**බාතිය රජවන් පැරකුම් දූන** රද

**ජෝතිය වතසියුරගසෙන් රුස්** කර

**ජෝතිය සිටු නරවර ගනඳර** කඳ

**බීතිය කැරැගියෙ පරසක්වල** වැද

(පැරකුම්බා සිරිත 48 කවිය)


ඒ අනුව ජෝතිය සිටු හා සෝජාත සිටු යනු එක ම තැනැත්තෙකු බව අනාවරණය වේ.

### 3. දිවානවත්තේ ලංකාධිකාර


මඩවල ලිපිය ලියා ඇත්තේ ජෝතිය සිටාන (දිවානවත්තේ ලංකා අධිකාර) හා ඇපාණ (දන්තොටවතුරේ දෙවන්) නමැත්තන් විසිනි. මෙහි ප්‍රධානියා වන්නට ඇත්තේ දිවානවත්තේ ලංකා අධිකාර බව සැලකිය හැකි ය. මන් ද පසුව උඩරට ස්වාධීන වන තැනැත්තා ද ඔහු වන බැවිනි. එසේ ම මහගම සන්නස ප්‍රදානය කරන්නේ ඔහු විසින් පමණක් වීම ය. මහගම සන්නසේ ඇපාන හෝ දන්තොටුවතුරේ දෙවන්ගේ නම සඳහන් නැත. මෙයින් පෙනී යන්නේ යකඩ කර්මාන්තයේ යෙදුන ශිල්පීන්ට මෙසේ ඉඩම් ප්‍රදානය කිරීමේ මූලිකත්වය ගත්තේ ජෝතිය සිටාණන් බව ය. රාජාවලියේ ඔහු **සෝජාත සිටු රජ** යනුවෙන් සඳහන් කර තිබීමත් පසුව ඔහු උඩරට ස්විධීන වීමත් අනුව ජෝතිය සිටු හා ඇපාණ දෙදෙනාගෙන් බලවත්ව සිටියේ ජෝතිය සිටු බව පැහැදිලි ය. මේ දෙදෙනා උඩරට බලයට පත්වූයේ කෙසේ ද ඔවුන්ගේ වංශ පරම්පරා මොනවාද යන්න පිලිබඳ නිශ්චිත තොරතුරු මෙතෙක් හමු වී නැත. වර්ෂ 1415 දී ජයවර්ධනපුර කෝට්ටේට රාජධානිය බිහි වීමට පෙර රටේ පාලන බලය පැවැතියේ උඩරට ගම්පොල ය. ඊට සමාන්තරව දැදිගම ද පාලකයින් සිට ඇත. ගම්පොල සමයේ වෙළඳ කුලයන් දේශපාලනයේ ඉහල තලයට නැගුන බව එකල අගමැති කෙනෙකුව සිටි අලකේශ්වර ගැන නියම්ගම්පාය ලිපියේ, ඔහු වෙළඳ කුලයට සිළුමිණක් (වණික් වංශ සිබාමණි) යනුවෙන් සඳහන් වීමෙන් පෙනේ (වරසම්බෝධි හිමි 1948). සිටු යනු වෙළඳ කුලයට අයත් හෙයින් ජෝතිය සිටු ද ගම්පල යුගයේ සිට බලවත්ව පැවැති එවැනි පවුලකට අයත් විය හැකි ය. නියම්ගම්පාය ලිපියේ මීට සුලු කලකට පෙර **ජයමහලේ සිටු** නමින් එවැනි බලවත් සිටාණ කෙනෙකු සිටි බද ද සඳහන් ව තිබේ. ජෝතිය සිටු ද බලවත් පවුලකට අයත් වන්නෙකු බව සිතිය හැක්කේ ඔහු ස්වාධීන වීමට කළ උඩරට කැරැල්ලෙන් පරාජය වීමෙන් ඔහුගේ පලායාමෙන් හෝ මරණයෙක් පසු අම්බුලුගල කුමාරයා විසින් ඔහුගේ ඥාතීන් අල්ලා ජයවර්ධනපුරයට ගෙන ආ බව රාජාවලියේ සඳහන් වීමෙනි. එසේ කරන්නට ඇත්තේ ඔවුන්ට කිසියම් රාජ්‍ය උරුමයක් තිබෙන්නට ඇති අතර පසුව ඒ සඳහා සංවිධානය වීමක් වැලැක්වීමට විය හැකි ය.

මඩවල ලිපියේ අවසානයට අත්සන සඳහන් දන්තොටවතුරේ දෙවන් යනු ලිපියේ ආරම්භයේ සදහන් ඇපාණ බව පරණවිතාන ද පිලිගෙන ඇත (Chandra Rai, 1960, 676 p) දන්තොටවතුර යනු නම් පොතට අනුව යටිනුවර පෙදෙසේ පිහිටි දන්තුරේ බව කොඩ්රින්ටන් පෙන්වා දී ඇත (Epigraphia Zeylanica Vol.111 p.237). එහි ම සඳහන් පරිදි මෙම ග්‍රාමයේ සිටි කුමාරයෙකු දන්තුරේ **තුණයා බණ්ඩාර** යනුවෙන් සිඳුරුවාන රට බණ්ඩාරවලියේ සඳහන් ය. අස්ගිරි තල්පතේ ඇති තොරතුරු පාදක කර ගනිමින් එහි සඳහන් දොඩම්වල පරාක්‍රම ඇපා යනු මඩවල සෙල්ලිපියේ සඳහන් ඇපාණ බව මැන්දිස් රෝහණදීර පවසයි (රෝහණදීර 2009, 59). අස්ගිරි තල්පත දක්වන්නේ මීට සුලු කලකට පසු සේනාසම්මත වික්‍රමබාහු උඩරට බලය පැහැරගත් බවත්, පරාක්‍රම ඇපා ඌවේ දොඩම්වලට පැන ගිය බවත් ය. ඔහු දොඩම්වල පරාක්‍රම ඇපා නම් වූයේ එනිසා බව රෝහණදීර පවසයි. එපමණක් නොව ඔහු සවැනි පැරකුම්බා කාලයේ සිට ම දැදිගම සිට උඩරට ඇතුලු පෙදෙස් පාලනය කළා යැයි කියනු ලබන දැදිගම පරාක්‍රමබාහු නමැත්තෙකුගේ මුණුපුරෙක් බව අස්ගිරි තල්පත අනුව පවසයි. ඔහු 1460 මියයාමෙන් පසු උඩරට ජයවර්ධනපුරයට අයත්ව ජෝතිය සිටු යටතේ පාලනය වූ බව රෝහණදීරගේ අදහසයි. රාජාවලිය පවසන්නේ ජෝතිය සිටු එළවීමෙන් පසු සූර්ය වංශයෙන් (රිවි කුල) පැවත එන ගම්පොල කුමාරයාට උඩරට රාජ්‍ය බලය පැවැරූ බවයි (රාජාවලිය 77 පිට). මෙම ගම්පොල කුමාරයා යනු මඩවල ලිපියේ ඇපාණ නමින් අත්සන් කරන දන්තොටවතුරේ දෙවන් බව මහාචාර්ය පරණවිතාන පිලිගනී (පරණවිතාන, 1972, 639 පිට).


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk





රූපය 02. මඩවල ශිලා ලේඛනයේ ස්පර්ශිත ඡායා පිටපත (EZ. III, no 24)



ඇපණ[2] වම්හැ                    සිරි සඟබො ශ්‍රී
ජොති සිටා                    පරාක්‍රම බාහු ච
ණ වම්හ                    ක්‍රවර්ති්සවමි[3]න්ව
                    ගන්සෙට සතලි
සවනෙන්[4] මතු හවුරුදු වෙස
ග පුර දුම්ව[5]ර බද ගම්සැලැස්

රූපය 03. මඩවල ශිලා ලේඛනයේ සිංහල පරිවර්තනය 1 සිට 6 දක්වා පෙළ (EZ. III, no 24)



මෙන් මඩවල කුබුරු බිජුවට ස[1]මු
ණ හා මෙහි බද ගම්මුදල ගස කො
ළ වල්පිට ඇතුළුවූ[2] තැන් සිදුවුලෙල
අචාරි පරමණාසාට ප්‍රවෙණිට[3] සලස්වා
මෙකු පුත් සුරියාට ප්‍රවෙණි සැලස්
මට ඉර සඳ[4] ඇති තෙක් පවතිනා ලෙසට ස
ලස්වා මි[5]ට ඉදිරියෙ දවස රජ යුවරජ
මහා අමාතප්දි[6] කවර තරම් කෙනකුන්
ගෙනුත් අවුලක් උබරණයක්[7] නො කි
යනා නො කරණ ලෙසට සලස්වා දන්නොට
වතුරෙ දෙවන් දිවාණවතෙන ලංකා අධිකා
රින් මැදවැ මෙ දිවෙල්පත්කඩ දුන් බවට
දුම්ව[8]ර අසම්පඩි දසදෙන මැදව කෙටවූ[2]
සිලාලෙඛයයි[9]

රූපය 04. මඩවල ශිලා ලේඛනයේ සිංහල පරිවර්තනය 7 සිට 20 දක්වා පෙළ (EZ. III, no 24)

## 4. බලු කපුටු රූප යෙදීම

මෙම සන්නසේ පසෙක බලු කපුටු රූප දෙකක් කොටා තිබේ. රජරට ශිෂ්ටාචාර සමයේ අටවන සියවසේ සිට ආගමික ස්ථානවලට කරන ලද ප්‍රදානයන් ඊට හානි කරන්නවුන්ගෙන් ආරක්ෂා කර ගැනීමේ උපක්‍රමයක් වශයෙන් ඒවාට හානි කරන්නන් මතු භවයේ බලු කපුටන් වන බව සටහන් කර ඇත. ඒ හැර තවත් එවැනි විපාක වර්ග ගණනාවක් අභිලේඛනවල සඳහන්ව ඇත. ආගමික ස්ථානවලට පරිත්‍යාග කළ දෙයක් අපහරණය කළ කෙනෙකුට මතු භවයේ ආගමික වශයෙන් විපාක දෙන ශාප කිරීම් පමුවෙන් ම ආරම්භ


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

වී ඇත්තේ භාරතයේ ය. එරට මුල් ශිලාලිපිවල සඳහන් වන්නේ හින්දු ආගමික දේපලකට (බ්‍රහ්මදේය) හානි කරන්නෙකු ගවයෙකු මැරීම බ්‍රාහ්මණයෙකු මැරීම හෝ පංච මහා පාප කර්මයන් කිරීමේ පාපයන් ලබා ගන්නා බව ය (Fleet, 1888, 32-71 pp) පසු කල ඊට වඩා ප්‍රබල ආකාරයේ දඬුවම් සඳහන්ව ඇත. නිදසුනක් වශයෙන් එක් ශිලාලිපියක එසේ ආගමික දීමනාවකට හානි කළ කෙනෙකු දිය රහිත වින්ද්‍යා වනයෙහි වියළි රුක් බෙනයක කාල සර්පයෙකුව උපදින බව දක්වා ඇත[1] (Epigraphia Indica Vol. VI, 211 p).

ඉන්දියාවේ පැවැති මෙම සම්ප්‍රදාය ක්‍රිව අටවන සියවසේ සිට ලංකාවේ ආගමික ප්‍රදානයන් ආරක්ෂා කර ගැනීමටත් යෙදීම ආරම්භ වී තිබේ. පළමු වරට මෙවැවැනි ප්‍රකාශයක් දක්නට ලැබෙන්නේ එම කාලයට අයත් ගැරඬිගල සෙල්ලිපියේය. එහි ***මෙ ලෙනත් බහාලූ කුඹුරත් අවුල් කළ කෙනෙක් බුදිනා බත් නොලැබෙත් පර ජන්මයේ බලු කවුඩු වෙත්වයි කැපකළ සෙනසුන බැවිනි*** යනුවෙන් සඳහන් ය (Epigraphia Zeylanica Vol. III, 198 p). මෙම ලිපිය ක්‍රිව 724-730 තෙවන කාෂ්‍යප රාජ්‍ය සමයට අයත් ය. එසේ ම මීට පෙර කාලය ඉන්දියාණු බලපෑම් මෙරටට තදින් දක්නට ලැබුණ අවධියකි. **කැපකළ සෙනසුන** බැවිනි යන්නෙන් මෙය ආරාමයකට පුදන ලද්දක් බව පැහැදිලි ය. මෙරට පැහැදිලි නීති ක්‍රමයක් පැවැති බවට සාධක ලැබෙතත් එවැනි නීතියකින් ආරක්ෂා නොකොට ආගමික වශයෙන් මෙවැනි දඬුවමක් සදහන් කිරීමට හේතු ඇත. මීට පෙර හත්වන සියවස පුරාවට ම නීතිය ක්‍රියාත්මක කළ යුතු පාලකයින් විසින් ම ආරාම දේපළ කොල්ලකෑමක් සඳහන් වන හෙයින් එසේ කරන්නන්ට පර භවයෙහි මෙවැනි විපාක ලැබෙන බව සඳහන් කරමින් මෙවැනි ප්‍රදානයන් ආරක්ෂා කිරීම අරඹන්නට ඇත. ක්‍රි.ව. 614 සිට වසර 70ක් පමණ රටේ පැවැති තත්ත්වය මහා වංශයේ විස්තර වන්නේ මෙසේ ය.

> ‘‘.......... මේ රජුන් දෙදෙනාගේ යුද්ධයෙන් පෙලුන සියලු ලෝවැසි තෙමේ උපද්‍රැත වූහ. ධන ධාන්‍යයෙන් ද පිරිහිණි. දාඨෝපතිස්ස රජ තෙමේ පූර්ව රජුන් සතු සියල්ල නැසීය. තුන් නිකායෙහි දාගෙවල්වල වටිනා වස්තු ගති. සටන් කිරීම සදහා ථූපාරාමය බිඳ වස්තු ගත්තේය. රුවන්වැලි සෑයෙහි ඡත්‍රය කඩා එහි වස්තු ගත්තේ ය. මහා පාලි දාන ශාලාවේ බත් ඔරු තමාට උපකාරී වූ දෙමලුන්ට දුණි. දෙමලු ධාතුගෙය විනාශ කළහ. අග්බෝ රජුගේ මල් කසුප් යුව රජතුමාගේ හමුදා නඩත්තුව සඳහා ථූපාරාමය බිඳ පූර්ව රජවරුන් විසින් පුදන ලද වස්තුව පැහැර ගති ..........’’
>
> (මහාවංශය 42:129-142)

ලංකාවේ මෙවැනි පාඨ ලිවීමත් බලු කවුඩු රූප කෙටීමත් ආරම්භ වන්නට ඇත්තේ මේ තත්ත්වය යටතේ විය යුතු ය. මේ සඳහා වෙනත් සතුන් නොයොදා බල්ලා කපුටා පමණක් යොදා ගත්තේ කුමක් නිසා ද? ගම් නිවාස අසළ අහර සොයමින් ඉඳුල් කමින් නිතර හැසිරෙන සතුන් දෙදෙනෙකු ලෙස මහ ජනතාවට නිතර දක්නට ලැබුණේ මේ සතුන් දෙදෙනා ය. ඒ නිසා පින් තකා අතීතයේ සිට ම බලු කපුටු දාන දීම සිදුව ඇත. නිදසුනක් වශයෙන් තෙවැනි මිහිඳු රජ කපුටන්ට දානයන් දීම පිලිබඳ පුවතක් මහාවංශයේ සදහන් ය (මහාවංශය 47-36). මහලු බමුණෙකු සමඟ විවාහ වීම ගැන අමිත්තතාපාට යෙහෙලියන් විහිලු කරන්නේ ***තී ගිය ජාතියෙහි කවුඩන්ට පිඬු දුන් කල තී ලූ පිඬු කෑයේ මහලු කවුඩෙකු වනැ*** යි යනුවෙන් මේ සිරිත ගැන බුත්සරණෙහි සඳහන් ය (බුත්සරණ 1996, 349 පිට). ගුරුවරයාට අපහාස කිරීමේ පාපයෙන් කෙනෙකු බල්ලෙකු වී උපදින බව මනු ධර්ම සූත්‍රයේ සදහන් ය (මනුස්මෘතිය 1991, 201 පිට). මේ ආකාරයට අතීතයේ සිට ම සෙල්ලිපි ගණනාවක මෙසේ බලු කවුඩු රූප කෙටීම දක්නට ඇත.

එහෙත් මඩවල ලිපිය ආගමික ස්ථානයකට කරනු ලබන දීමනාවක් නොව පුද්ගලයෙකුට දෙනු ලබන්නකි. එවැන්නක තත් අදහසින් බලු කවුඩු රූප යෙදීම ඉහත කී සෙල්ලිපි සම්ප්‍රදාය අනුගමනය කිරීමක් විය හැකි ය. නොඑසේ නම් ඉදිරියේ සිදුවන යුද්ධය එනම් සෝජාත සිටු උඩරට ස්වාධීන වීම හා ඊට විරුද්ධව ඇති වූ ආක්‍රමණය ගැන උපකල්පනය කොට එවැනි අවස්ථාවක සතුරු පාලකයින්ගෙන් හෝ

---

[1] බහුභිර්වසුධා දත්තා චානුපා ලිතා යස්‍ය යස්‍ය
යදා භූමිස්තස්‍ය තදා ඵලම් ෂෂ්ටි සහස්‍රාණිස්වර්ගෙ
මෝදති භූමි දේඅච්ජේත්තා චාත්‍රමන්තා එ තදනෙ‍්‍යව නරකේ වසත්
වින්ද්‍යාට විශ්වතො යාසු ශුෂ්ක තෝටරක වාසින: කෘෂ්ණාහයෝ
ජායන්තේ බ්‍රහ්මදේයාපහාරකා (Epigraphia Indica Vol, VI p.211)

ආක්‍රමණිකයන්ගෙන් ප්‍රදානය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් මෙසේ ලියන්නට ඇත.

## 5. සමාලෝචනය

මහනුවර රාජ්‍ය ලේඛනාගාරයේ පවත්නා මහගම තඹ සන්නස ප්‍රථම වරට ප්‍රකාශයට පත් වන්නේ මෙම ලිපියෙනි. මෙම සන්නසෙන් දිවානවත්තේ ලංකා නමැත්තෙකු විසින් මහසෙනයා නමැත්තෙකුට ප්‍රවේණිකොට සලස්වා මහගමින් කුඹුරු හා ඉඩ කඩම් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් විස්තර කෙරේ. ලංකා ඉතිහාසයේ වසර 46කට වඩා පාලනය කරන ලද පරාක්‍රමබාහු කෙනෙකු වේ නම් ඒ 6 වැනි පරාක්‍රමබාහු රජු වන අතර ලිපියේ අන්තර්ගතයට අනුව මේ ලිපිය අයත් වන්නේ එතුමාගේ රාජ්‍ය කාලයටය. එහි දීමනාව ප්‍රදානය කරන්නේ ද දිවානවතතේ ලංකාධිකාර හෙවත් ජෝතිය සිටුවරයා විසිනි. ජෝතිය සිටුවරයා යනු කවුරුන් ද යන්න සම්බන්ධයෙන් ඉතා දීර්ඝ සාකච්ඡාවක් මෙහි සිදු කෙරේ. මහගම සන්නසෙන් මහගම ඉඩකඩම් පවරා දී ඇත්තේ යකඩ කර්මාන්තයේ යෙදුන මහසෙනයා නමැත්තෙකුට හා ඔහුගේ පරම්පරාවටය. ලිපියේ අදහස් ප්‍රකාශ කිරීමේ දී වචනයෙන් විස්තර කිරීම් මෙන්ම බලු, කපුටු, ලෝහ වැඩ සඳහා යොදා ගන්නා උපකරණවල රූපසටහන් ආදිය මඟින් ද පැහැදිලි කිරීම් සිදුව ඇති ආකාරය මෙම ලිපියෙන් හඳුනා ගත හැකි වේ. ඉතා කෙටි තඹ පත්‍රිකාවක් වුව ද ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් තොරතුරු සම්පිණ්ඩනය කර ඇති ලේඛනයක් ලෙස මහගම තඹ සන්නස වැදගත් වන ආකාරය මෙහි පුළුල් ලෙස සාකච්ඡාවට බඳුන් වී තිබේ.

## 6. ආශ්‍රිත ග්‍රන්ථ


- ***උම්මග්ග ජාතකය*** 1899 සයිමොන් ද සිල්වා මුදලි (සංස්.), කොළඹ.
- ***නිකාය සංග්‍රහය*** 1908 වාසල මුදලි ගුණවර්ධන (සංස්.), කොළඹ.
- වරසම්බෝධි, ගුණලංකාර හිමි. (සංස්.) 1948 ***ගම්පල ඉතිහාසය***, කොළඹ.
- පරණවිතාන, එස්. 1972 ''1505 දක්වා කෝට්ටේ රාජ්‍යය'', ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය***, I කාණ්ඩය, II භාගය, හේම චන්ද්‍ර රාය (සංස්.), විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැළණිය, 625-641 පිටු.
- **පැරකුම්බා සිරිත** 1997 රෝහිණී පරණවිතාන (සංස්.), මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.
- ***මහාවංසො*** 1959 පී. බුද්ධදත්ත හිමි (සංස්.) කොළඹ.
- ***බුත්සරණ*** 1996 වැලිවිටියේ සෝරත හිමි (සංස්.), අභය ප්‍රකාශකයෝ, ගල්කිස්ස.
- ***දහම්සරණ*** 1865 කිරිඇල්ලේ ඤාණවිමල හිමි (සංස්.), ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ.
- ***මහාවංශය*** 1969 හික්කඩුවේ සුමංගල හිමි සහ බටුවන්තුඩවේ දේවරක්ෂිත (පරි.), ප්‍රථම භාගය, කොළඹ.
- **මනුස්මෘති හෙවත් මානව ධර්ම ශාස්ත්‍රය** 1991 පරි. පියදාස නිශ්ශංක සීමාසහිත ඇස්. ගොඩගේ සමාගම කොළඹ 10.
- රෝහණදීර, මැන්දිස්. 2009 ***අස්ගිරියෙන් උඩරට ඉතිහාසය***, තරංජි ප්‍රින්ටර්ස්, මහරගම.
- සුරවීර, ඒ.වී. 1997 ***රාජාවලිය,*** අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
- ***Digha Nikaya***, 1947 T.W. Rhys Davids and J. Carpenter (Ed.), PTS edition, London.
- ***Epigraphia Zeylanica***, 1933, Don Martino de Zilva Wickremasinghe and H. W, Codrington, (Eds.) Vol. III, Humphrey Milford Oxford University Press for the Government of Ceylon, London.
- ***Epigraphia Indica*** 1979 Vol III (1894-95), Archaeological Survey of India, E. Hultzsch (Ed.) Janpath, New Delhi.
- Fleet, J. F. 1888 ***Corpus Inscriptionum Indidicrum***, Vol. III, Superintendent Of Government Printing, Kolkata, India.
- Lawrie, A.C. 1898 ***Gazeteer of the Central Province of Ceylon***, Colombo.
- Paranavitana, S. 1960 ***University of Ceylon History of Ceylon***, Vol.1, Part II, Hema Chandra Rai (Ed.), Ceylon University Press.



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk